# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2314/80 - 2023 ජනවාරි මස 14 වැනි සෙනසුරාදා - 2023.01.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 5/2005

**2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත**

2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 27 වන වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ජනාධිපති නීතීඥ ආචාර්ය **විජයදාස රාජපක්ෂ**,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2023 අංක 1 දරන සමථ මණ්ඩල විශේෂ වර්ගවල ආරවුල් (සමථකාරවරයන්ගේ සුදුසුකම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරවුල්) පනත යටතේ සාදන ලද 2021 දෙසැම්බර් මස 21 වන දින අංක 2259/11 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති විශේෂ සමථ මණ්ඩල ප්‍රදේශ සම්බන්ධයෙන් වන සමථකාරවරයන්ගේ මූල මණ්ඩලයක සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා, යම් තැනැත්තකු :-

   (අ) වයස අවුරුදු 35 සහ 75 අතර විය යුතු ය ;

   (ආ) (i) අවම වශයෙන් වසර පහක අඛණ්ඩ කාලසීමාවක් මාණ්ඩලික නිලධාරී මට්ටමේ රජයේ නිලතල දරන හෝ දැරූ නිලධාරියෙකු විය යුතු ය ;



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ii) පුද්ගලික අංශයේ, රාජ්‍ය නොවන සංවිධානයක, බැංකුවක හෝ සංස්ථාවක ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරක් දරන හෝ දැරූ තැනැත්තකු විය යුතු ය ; හෝ

(iii) කිසියම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ ස්ථාපිත පිළිගත් වෘත්තීය හෝ උසස් අධ්‍යාපන අධිකාරියකින් ලබාගත් වෘත්තීය හෝ අධ්‍යයන සුදුසුකමක් ලබා තිබිය යුතු ය ; සහ

(ඇ) සමථකාරවරයන්ගේ මූල මණ්ඩලයක සාමාජිකයකු ලෙස කටයුතු කිරීම සඳහා මනා මානසික සහ ශාරීරික යෝග්‍ය තත්වයක් සහිත විය යුතු ය.

3. සමථකරණයේ පළපුරුද්ද හෝ සමථකරණයේ සිද්ධාන්ත සහ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

EOG 01 - 0133

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.